# ආදරය - සීමාවක් නැති හැඟීමක්



සිරිවිමල මුතුකුමාරණ

ගැමි වහරෙහි ඇති "කෝකටත් තෛලය" යනු ඔබ අසා ඇතුවා හෝ නැතුවා විය හැකිය. එහි නියම අදහස නම් වේදනාව - ඇවිල්ල - හිරිවැටීම ආදී වූ විවිධ අසනීප තත්වයන් සඳහා එකම බෙහෙත් තෙලක් පාවිච්චි කිරීම යනුය. මෙම අදහස ආශ්‍රිතව සිතා බලන විට "ආදරය" යන වචනයත් " කෝකටත් තෛලය" ලෙසම මිනිස් සිතේ මතු වන විවිධ හැඟීම් විලාසයන් සඳහා ලෙහෙසියට - පහසුවට යොදන වචනයක් වී තිබේ. මෙම ප්‍රකාශයෙහි හරි - වැරැද්ද බැලීමට නම්, මිනිස් සිතෙහි විටින් විට අවස්ථානුරූපව මතුවන සිතිවිලි පිළිබඳව සූක්ෂමව විග්‍රහයක් කළ යුතුය.

ජිවිතයක ආරම්භය ළඳරු අවස්ථාව බව අප හැමදෙනාම දන්නා කරුණකි. එම අවස්ථාවෙහි මවගේ සිතෙහි දරුවා ගැන මතු වන හැඟීම ද සමාජයේ එක වරටම හැඳින්වෙන්නේ 'අම්මා දරුවට හරිම ආදරෙයි' සහ 'දරුවා අම්මට හරි ආදරෙයි' ආදී වශයෙනි. මවට දෙවැනි දරුවෙක් ලැබුණු පසු වැඩිමල් දරුවා බාල දරුවා අතර ඇති වන හැඟීමද 'අයියා මල්ලිට හරි ආදරෙයි' යනුවෙන් ප්‍රකාශ වෙයි.

ළමයාගේ පාසල් ජිවිතය ඇරැඹුණු පසු " ළමයා පන්තියේ ඔක්කොම ළමයින්ට ආදරෙයි" යනුවෙන් ද, ව්‍යවහාර වෙනු සිරිතය.

කෙනෙකු තරුණ වියට පත් වූ පසු 'අල්ලපු ගෙදර ගැණු ළමයා එක්ක ආදරේක පැටලිලා' වැනි කියුම් අප කොතෙකුත් අසා ඇත. කුඩා ළමයා බෝනික්කන්ට පැටවුන්ට ද ආදරය කරති.

මෙවැනි බොහෝ යෙදුම් ගෙන හැර දැක්විය හැකිය. නමුත් අප ඉදිරියේ ඇති ප්‍රශ්නය නම් ඉහත දැක්වූ සෑම අවස්ථාවක ම මිනිස් සිතෙහි ඇතිවූයේ එකම හැඟීම - එනම් ආදරය ද ? විය නොහැකිය.

එක් එක් අවස්ථාවේ සිතෙහි මතු වී ඇත්තේ එක්නෙකට ඉතා සුක්ෂම ලෙස වෙනස් වූ චිත්ත රූපයකි. එසේ නම් අප විවිධ වූ සෑම අවස්ථාවක් ම එකම වචනයකින් (ආදරය) අර්ථ කථනය කිරීම නිවැරදි ද?

මවත් දරුවාත් අතර ඇත්තේ මව් සෙනෙහස සහ දරු සෙනෙහස නොවේද ? පාසලේ පංතියේ ළමයින් අතර ඇත්තේ මිත්‍රත්වය යනු වඩාත් නිවැරදි නොවේද ? තරුණ ගැහැණු ළමයෙකු සහ පිරිමි ළමයෙකු අතර ඇති වනුවේ ප්‍රේමය / ආලය නොවේද ? පාසල් ළමයා ගුරුවරයෙක් වෙත ඇත්තේ ගුරු ගෞරවය නේද ? කුඩා ළමයින් බෝනික්කන්ට සහ සුරතල් සතුන් වෙත ඇත්තේ අහිංසක ආසාවක් පමණක් නේද ?

මේ සෑම අවස්ථාවක් ම සිතෙහි ඇති වන චිත්ත ස්වභාවය හා ගලපා බලන විට ආදරය යන වචනය සමාජ ව්‍යවහරය සඳහා කොපමණ පහසු වුවත් සියුම් වූ මානසික ක්‍රියාකාරිත්වය පැහැදිලි කිරීමට නම් එය ප්‍රමාණවත් නොවන බව නම් පිළිගත යුතුව තිබේ. මේ පිළිබඳව පාඨක වියතුන් විසින් තව දුරටත් අදහස් දැක්වුව හොත් එය ඉතා රසවත් කතාවක් වෙතැයි සිතමි.

53" David Street
Dandeneng Vic. 3175







